ගොවි කටයුතු අධ්‍යයන 3(1) 1993-54-64

# ශ්‍රී ලංකාවේ ගොවිකටයුතු සම්බන්ධතාවන්ට අදාල ප්‍රතිපත්ති ප්‍රශ්ණ සහ පර්යේෂණ ප්‍රමුඛතා

*නිමල් ප්‍රනාන්දු සහ නිව්ටන් ගුණසිංහ*

ශ්‍රී ලංකාවේ ආර්ථිකයෙහි කෘෂිකර්ම අංශයට ප්‍රධාන තැනක් ලැබෙන නිසා කෘෂිකර්ම වර්ධනය හා බෙදා හැරීම අනුව ගොවි කටයුතු සම්බන්ධතාවන් ඉතාමත් වැදගත් වේ. ගත වූ දශකය ඇතුළත, වී නිෂ්පාදනය ශීඝ්‍රයෙන් වැඩෙද්දී සාම්ප්‍රදායික කෘෂිකර්ම අංශයෙහි හේතුන් ගණනාවක් නිසා ගොවිකටයුතු සම්බන්ධතාවන්හි අර්ථවත් විපර්යාස සිදු වී ඇත.

සිදු වී ඇති විපර්යාස රැසක් පර්යේෂකයන් බොහෝ දෙනෙකු විසින් සටහන් කර තිබේ. එහෙත් ඒ විපර්යාසයත්, ඒ විපර්යාසයන්ට සම්බන්ධ වූ කරුණුත්, ප්‍රතිපත්තියක් ලෙස සකස් වීමට ඉවහල් වන විධියේ සම්පූර්ණ විශ්ලේෂණයක් කර ඇත්තේ ස්වල්ප දෙනෙකි. මේ ලිපියේ කතෘවරු විසින්, තිබෙන පොතපත සමීක්ෂණය කර, වතු වශයෙන් වගා නොකල භෝග අංශයෙහි ගොවිකටයුතු සම්බන්ධතාවන්ට අදාළ වැදගත් කරුණු බොහෝමයක්ම හඳුනාගෙන ඒවායින් කවරක් ගොවිකටයුතු පිළිබඳ කෙටිකාලීන වුත් මධ්‍යම කාලීන වුත් වැඩසටහනකට ඇතුලත් විය යුතු දැයි පෙන්වා දී තිබේ.

*හැඳින්වීම*

ආර්ථික ප්‍රතිපත්ති සකස් කරන්නන්ට ගොවිකටයුතු සම්බන්ධතා ඉතා වැදගත් වන්නේ එය භූමියේ ඵලදායීත්වයට අර්ථවත් බලපෑමක් කරන නිසාත්, විවිධ සමාජ - ආර්ථික මට්ටම් අතර ආදායම් බෙදී යන ආකාරය නැතහොත් කෘෂිකර්ම අංශයෙන් ලැනවෙන අතිරික්තය බෙදීයන ආකාරය නිශ්චය කෙරෙන නිසාත්ය. වැඩෙන ගොවි ආර්ථිකයන්හි සිටින ප්‍රතිපත්ති සකස් කරන්නන් විසින් ගොවිකටයුතු සම්බන්ධතා කෙරෙහි අවධානය යොමු කරන්නට බොහෝ විට පටන් ගනු ලැබුයේ පවත්නා සම්බන්ධතා කෘෂිකර්ම ඵලදායිත්වයේ වර්ධනයට බලවත් බාධකයක් බවත්, ආර්ථිකයේ දියුණුව හා වැඩීම ප්‍රමාද කරන බවත් පෙනී ගිය විටය. එපමණක් නොව ප්‍රතිපත්ති සකස් කරන්නේ ඒ ගොවිකටයුතු සම්බන්ධතා පිරික්සීමට උනන්දු වන්නට පටන් ගන්නේ රටේ තිබෙන සමාජ හා දේශපාලන ක්‍රමයට තර්ජනයක් වන අස්ථාවරකාරී බලවේගයක් විය හැකි සාධක ඒ සම්බන්ධතාවලින් මතු වන අවස්ථාවකය. එවැනි අවස්ථාවක් මතු වූ විට ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට රජයට පුළුවන. ගොවි පන්ති අතර ඇති අභ්‍යන්තර ගැටුම් විසින් උනන්දු කරනු ලැබ, බලපෑම් ඇති කර, රජය මැදිහත් විය යුතු ආකාරයටත් එහි ඵලදායිත්වයටත් සීමා පැනවීමට ඉඩ ඇත. එහෙත් එයින්ම ඉඩම් ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල නිශ්චය නොවේ. ඉඩම් ප්‍රතිසංස්කරණය වන්නේ බලපොරොත්තු වන විශේෂ ක්‍රමයකට ගොවිකටයුතු සම්බන්ධතා යළි සකස් කිරීම පිණිස රජයේ මැදිහත් වීමයි. (ගුණසිංහ 1982:46). එම ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිව්‍යූහකරන වැඩපිළිවෙල ක්‍රියාත්මක වත්ම කෘෂිකර්ම ඵලදායිත්වයේ වර්ධනය දිගටම සිදුවිය හැකිය. සාමාන්‍ය වශයෙන්, රටක ප්‍රධාන භෝග නිෂ්පාදනයේ වර්ධනය ඉහළ යෑම තුල ප්‍රතිපත්ති සකස් කරන්නන්ගේ අවධානය ගොවිකටයුතු සම්බන්ධතාවන් කෙරෙන් ඈත් වී ඇණ සිටින

තත්ත්වයකට පත් විය හැකිය. එහෙත් එය සිදු වන්නේ කෙටි කාලයකටයි. භෝග නිෂ්පාදනය ඉහළ යෑමේ නම්‍යතාව පිටුපස පවතින ගොවි කටයුතු සම්බන්ධතාවන්ගේ ක්‍රමානුකූලව පිරිහීමේ වේගය ඇතැම් විට වැඩිවිය හැකිය. පසුගිය දශකය තුල ශ්‍රී ලංකාවේ සමහර විට සිදුවන්නට ඇත්තේ ද එයයි.

මෑත අතීතයෙහි රටේ ගොවි සම්බන්ධතාවන්හි සිදු වූ වෙනස්වීම් පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීම මේ ලිපියේ පරමාර්ථය නොවේ. මේ ලිපියෙන් තැත් කෙරෙන්නේ සාම්ප්‍රදායික කෘෂිකාර්මික අංශයෙහි ගොවි සම්බන්ධතාවන්ට අදාල ප්‍රධාන ප්‍රතිපත්ති ප්‍රශ්ණ ඉස්මතු කර, ප්‍රතිපත්ති සකස් කරන්නන්ට උපකාර විය හැකි පුළුල් පර්යේෂණ වැඩසටහනක් හඳුනාගෙන ඉදිරිපත් කිරීමයි.

### ගොවිතැන් ක්‍රම

මෙහිදී රටේ සාම්ප්‍රදායික කෘෂිකර්ම අංශයේ විවිධ ස්වභාවය කෙරෙහි අවධානය යොමු කිරීම මුලින්ම වැදගත්ය.

> ශ්‍රී ලංකාවේ ගොවීන්ගේ කෘෂිකර්මය පොදු අංග කීපයකින් සමන්විත වුවත්, ලොකු විවිධත්වයක් ප්‍රකට කරයි. එය මූලිකව තුවර කලාවියෙහි යැපීමට උපකාර වූත්, කැලෑවෙන් වටවූත් ගම්වල සිට යාපන අර්ධද්වීපයේ බෙහෙවින් වෙළඳ පොළ ඉලක්ක කර ගත් වගා කටයුතු දක්වාද; උඩරට සමහර ගම්වල ඇතැම් වෘක්ෂ භෝගයන්ගේත් ඉඩම් බදු ලබා ගැනීමේ සිට දකුණේ වියලි කලාපයෙහි ශ්‍රමය අධිකව උපයෝගී කර වී ගොවිතැන් ක්‍රම දක්වාද, නිලධාරීන් විසින් පරිපාලනය කරනු ලබන ගොවීන් විශාල ව්‍යාපාරවල සිට බහුජාතික ව්‍යාපාරවල කර්මාන්තශාලා සඳහා කෘෂිකාර්මික අමුද්‍රව්‍ය නිෂ්පාදනය දක්වා ද, විවිධ වේ. (ගුණසිංහ 1965 : 1995)

මේ විවිධත්වය ඇතුලත, ගොවි සම්බන්ධතාවන්ට බලපාන විපර්යකාරී බලවේග, සහ ඒ බලවේගයන්ගෙන් ඇතිවන වෙනස්වීම් නොයෙක් ස්වරූප ගනී. එය වෙනත් ආකාරයකට කියතොත් එකම බලවේග මගින් විවිධ ගොවි කටයුතු ක්‍රම තුළ ගොවි සම්බන්ධතාවන්ගේ වෙනස්වීම් විවිධ කරවිය හැකිය. සම්බන්ධතාවන්ගේ ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක විපර්යාසයන් සෑම පලදා ක්‍රමයක් කෙරෙහි ද, ඉපැයෙන අතිරික්තය බෙදා හැරීමේ රටාව කෙරෙහි ද විවිධ අන්දමින් බලපෑමට ඉඩ ඇත. එබැවින්, ගොවි ක්ෂේත්‍රය අනුව කථා කිරීම පමණක් නොව ඒ තුල තිබෙන විවිධ ගොවිකටයුතු ක්‍රම හඳුනා ගැනීම ද වැදගත් වේ. විවිධ ගොවිකටයුතු ක්‍රමවල වැදගත් කම, විශ්ලේෂණයේ විෂය ප්‍රමාණය මත (නිදः ජාතික හෝ ප්‍රාදේශික) සහ ප්‍රධාන සැලකිල්ල, (නිදः නිෂ්පාදනයේ වැඩීම හෝ ආදායම් බෙදා හැරීම) අනුව වෙනස් විය හැකිය.උදාහරණයක් වශයෙන්, වී නිෂ්පාදනයේ වර්ධනය කෙරෙහි කෙනෙකුගේ සැලකිල්ල වැඩියෙන් යොමු වුවහොත්, වියළි කලාපීය ජනාවාස වල ඇති ක්‍රමයන්ට දක්වන සැලකිල්ල තෙත් කලාපයේ වී ගොවිතැන් ක්‍රමයන්ට දක්ව වන සැලකිල්ලට සමාන නොවේ. තවද, යමෙකුගේ විශ්ලේෂණයට ජාතික ආර්ථිකය විෂය නොවී ප්‍රදේශයක් විෂය වුවහොත්, අවශ්‍ය වන්නේ ඇතැම් ක්‍රම පමණක් පරීක්ෂා කර බැලීමයි.

තවත් වැදගත් කරුණක් නම් ස්වභාවය සහ ගුණාත්මක පැත්ත කුමක් වුවද ගොවි කටයුතු ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේ සාර්ව සමාජ - ආර්ථික හා දේශපාලනික පරිසරයක් තුලය. වෙළඳ පොලේ ඒකාබද්ධතාවය හා රජයේ මැදිහත්වීමේ ප්‍රමාණය ආදී විවිධ සාධක අනුව ගොවිකටයුතු ක්‍රමයත් සාර්ව ක්‍රමයත් අතර සම්බන්ධය දුර්වල විය හැකිය: මධ්‍යස්ථවිය හැකිය: නැතහොත් ප්‍රබල විය හැකිය. එමනිසා යම් ක්‍රමයක් සම්බන්ධ වෙනස්වීම් පැහැදිලි කිරීම පිණිස සාර්ව ක්‍රමයෙන් උද්ගත වන විපර්යකාරී බලවේග ද විභාග කර බැලීම අවශ්‍යය. මේ අනුව ගොවිකටයුතු ක්‍රමයක් සංකල්පනය කළ හැක්කේ සාර්ව සමාජ - ආර්ථික සහ දේශපාලන ක්‍රමයක් ඇතුලත ක්‍රියාත්මක වන අනුක්‍රමයක් ලෙසිනි.

ශ්‍රී ලංකාවෙහි ගොවි අංශය තුළ බොහෝ ගොවි කටයුතු ක්‍රම හඳුනා ගත හැකිය: ඒ ක්‍රම සමහරක් ගොවීන් පදිංචි කිරීමේ විශාල ව්‍යාපාර මෙන්, අනුක්‍රමිකව ව්‍යාප්ත වෙමින් පවතින අතර සමහර ක්‍රම නුවර කලාවියේ පැරණි ගම්වල දක්නට ලැබෙන පරිදි ශීඝ්‍රයෙන් අභාවයට යමින් පවතී. උඩරට ගම් වැනි ඇතැම් ක්‍රම චිරාගත සංස්ථා සහ චාරිත්‍ර රැකගෙන ඇති අතර, සමහරක්, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි සහ යාපනය අර්ධද්වීපයෙහි මෙන්, ශීඝ්‍ර කෘෂිකර්ම නවීකරණයක ප්‍රතිඵලයකි. සවිස්තරාත්මකව නොවී, වෙනස්වීම දක්නට ලැබෙන තරමක පුළුල් පෙදෙසක් තුල, ශ්‍රී ලංකාවේ ගොවි කෘෂි කටයුතුවල පහත සඳහන් අනුක්‍රම හඳුනාගත හැකිය.

(i) නුවර කලාවියෙහි කේන්ද්‍රීය වූ තනි වැවකින් පෝෂිත වූ පැරණි ගම්: මේ ක්‍රමය පිළිබඳ ගැඹුරු අධ්‍යයනයක් ශ්‍රීමත් එඩ්මන්ඩ් ලීච් ගේ "පුල් එලිය" නමැති ග්‍රන්ථයෙහි එයි. (1960)

(ii) රජයේ අනුග්‍රහය ලබන, විශාල ප්‍රාග්ධනයක් ආයෝජනය කරනු ලැබූ විශාල ජනාවාස ක්‍රම: මේ පිළිබඳ ඓතිහාසික සහ භූගෝලික විශ්ලේෂණයක් බී එච් පාමර් ගේ ලංකාවෙහි ගොවි ජනපද (1957) සහ සරත් අමුණුගමගේ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් වන "චන්ද්‍රිකා වැව" (1965) යන ප්‍රකාශනවල ඇතුලත්ය.

(iii) දීප ව්‍යාප්ත වෙළඳ පොලක් සඳහා ගෙවතුවල වෙළඳ භෝග අධික ලෙස වගා කිරීම : කුඩා කොටස් ප්‍රාග්ධනයත්, ශ්‍රමයත් අධිකව යොදා කෙරෙන මේ වගා ක්‍රමය යාපනය අර්ධද්වීපයෙහි දක්නට ලැබෙන්නෙකි. මේ ක්‍රමය පිළිබඳ කෙටි නිදර්ශනයක් ගුණසිංහගේ (1985) කෘතියෙහි දැක්වේ.

(iv) බහුජාතික සංස්ථා සමාගම් සමග සංකේතාත්මක සම්බන්ධයක් ඇති ගොවි කටයුතු: මේ ක්‍රමය යටතේ ලංකා දුම්කොල සමාගමට සැපයීම පිණිස හඟුරන්කෙත සුළු වැවිලිකරුවන් විසින් දුම්කොළ වැවීම වැනි බහුජාතික සමාගම් සඳහා කිසියම් භෝගයක් වගා කිරීමට ගොවීන් බැඳී සිටීම. මේ ක්‍රමය, මොණරාගල දිස්ත්‍රික්කයෙහි දක්නට ලැබෙන පරිදි, රජයේ ආධාර ඇතිව කරනු ලැබේ. මෙම ක්‍රමය පිළිබඳ විමර්ශනයක් අබේසේකර ගේ කෘතියෙහි (1985) ඇත.

(v) ගොවීන් වතු භෝග නිපදවීම : මේ ක්‍රමය බොහෝ සෙයින් දක්නට ලැබෙන්නේ සබරගමු පළාතෙහිත්, කලුතර සහ ගාලු දිස්ත්‍රික්කයෙහිත් ය. එහි කුඩා ඉඩම් හිමියෝ, වෙළඳ පොළ සඳහා තේ සහ රබර් නිපදවති. මෙම ක්‍රමය පිළිබඳ විමර්ශනයක් ප්‍රනාන්දු විසින් ඉදිරිපත් කර තිබේ. (1984)

ප්‍රශ්ණ..

විවිධ ගොවිකම් ක්‍රමයන්හි පොදු අංග දක්නට ලැබුණත් ඒවායෙහි තිබෙන ප්‍රශ්ණ විවිධ බව පෙනේ. ගොවි ආර්ථිකයෙහි දක්නට ලැබෙන ප්‍රශ්ණයන්ගෙන් ඉතා වැදගත් එකකි ගොවි ජනපද ව්‍යාපාරවල ගොවීන් කොන්වන ක්‍රියාවලිය. මහවැලි "එච්" කොට්ඨාශයෙහි ගොවිකටයුතු සම්බන්ධතා පිළිබඳව කුඩා මට්ටමේ අධ්‍යයන ගණනාවක්ම කිරීමෙන් පසු වික්‍රමසේකර (1985:114) සොයා ගත් කරුණු මෙසේ සම්පින්ඩනය කර ඇත.

(අ) හවුලේ අස්වැන්න ලබා ගැනීම, ඉඩම් බදු දීම සහ උගසට තැබීම.

(ආ) උගස් කිරීම සහ ඉඩමේ අයිතිය අහිමිවීම තුලින් ඉඩම් අයිතීන් කීප දෙනෙකුගේ අතට යෑම.

(ඇ) ණයවීම සහ වගා කිරීමට යන වියදම අධිකවීම හේතු කොට ගෙන ග්‍රාමීය ජනගහනයෙන් තරමක විශාල කොටසක් කොන් වී සිටීම.

(ඈ) එම තත්ත්වය නිසා ඉඩමේ පාලයෙන් කොටසක් පොහොසත් ගොවීන්, වෙළෙන්දන් සහ රජයේ නිලධාරීන් අතට යෑම: මේ කණ්ඩායම්වලට ස්වකීය තත්ත්වය තහවුරු කර ගැනීමට හැකි වී තිබෙන්නේ මුදල් ණයට දීමෙන් සහ වෙළෙඳ කටයුතු මගිනි.

"විවිධ ඉඩම් භුක්ති ක්‍රම ඇති වීම, අධික මහවැලි සංවර්ධන පෙදෙසට පමණක් විශේෂ වූ ලක්ෂණයක් නොවන" බව නිවැරදිව සඳහන් කරන වික්‍රමසේකර, "ගොවීන් අයින් කිරීමේ ක්‍රමයක් ඉඩම් භුක්තිය වෙනත් අය අතට පත්වීමේ පිළිවෙලත් තරමක කාල සීමාවක් ඇතුලත මතු වී ඇති තත්ත්වයක් බව" පෙන්වා දී තිබේ.

එම ක්‍රියාවලියට උපකාර වූ සාධක බොහොමයක් නොයෙක් පර්යේෂකයන් විසින් මෙසේ දක්වා තිබේ:

(අ) මිනිසුන් පදිංචි කිරීමේ වැඩසටහන වේගවත් කිරීම. (වික්‍රමසේකර 1985 : 114)

(ආ) තණබිම් නොතිබීම හේතු කොට ගෙන බර අදින හරකුන් නොමැතිවීම නිසා කෘෂිකාර්මික යන්ත්‍රවල පිහිට සෙවීම අනිවාර්යයෙන්ම සිදුවීම (සිරිවර්ධන 1984:13)

(ඇ) අස්වැන්න අසාර්ථකවීම හෝ ඉඩමට ජලය ප්‍රමාණවත්ව නොලැබීම (වික්‍රමසේකර 1965:114)

(ඇ) වගා වියදම් ඉහළ යෑම, ප්‍රාග්ධනය නොමැතිවීම, අදාළ ආයතනවලින් ණය ලබා ගැනීමට නුපුළුවන් වීම. (සිරිවර්ධන 1984:13:14: විදානපතිරණ, 1984: වික්‍රමසේකර 1985)

(ඉ) ඉතා අධික ප්‍රාග්ධනයක් අවශ්‍ය වන ඵැනු, මිරිස් වැනි ආදායම් භෝග වගාව සඳහා කෙලින්ම හෝ වක්‍රව පෙළඹවීම. (සිරිවර්ධන 1984:13:14)

(ඊ) නොකඩවා ආදායමක් ලබා ගැනීමසඳහා දෛනික වැටුප් ලබන කම්කරුවන් වශයෙන් වැඩ කිරීම අවශ්‍ය වීම. (වික්‍රමසේකර 1984:114)

ගොවීන් පදිංචි කරනු ලැබූ පෙදෙස්වල ගොවිකටයුතු සම්බන්ධතා පිරිහී ගොස් ඇති බව පැහැදිලි වන අතර, එවැනි තත්ත්වයක් වර්ධනය වීම වළකාලීම සඳහා නීතියෙන් පනවන ලද බාධක තිබියදීත් පිරිහීම සිදුවීම පුදුමයට කරුණක් නොවේ. නීති ක්‍රමයේ බොළඳ ස්වාභාවයත් සම ප්‍රමාණයේ ගොවිපලවල් බෙදා දීමට පනවූ "සමානාත්මතා" මතයත් ෂන්මුගරත්නම් (1985:71) විසින් මැනෙවින පෙන්වා දී තිබේ.

"ජන සමූහයක් තුල තිබෙන භෞතික, මූල්‍ය සහ බුද්ධි සම්පත් වල විෂමතා නිසා ක්‍රියාත්මක වන ඇතැම් මූලධර්ම නීති දෘෂ්ඨිය විසින් නොසලකා හැර තිබේ. මෙහිදී, ඉඩම් ප්‍රමාණ සමාන වුවත්, පුද්ගලික ආර්ථික ශක්තිය, ජලය සපයා ගැනීම, පොහොර සහ ආයතනවලින් ණය ලබා ගැනීම, අලෙවිය ආදියෙහිත් පදිංචිකරුවන් අතර තිබෙන තාක්ෂණ දැනුමෙහිත් අසමානතා ප්‍රකටව දක්නට ලැබේ. මේ අසමානතා ක්‍රමයෙන් එක්වී විෂමතා ඇති වෙයි".

නිෂ්පාදන වියදම හා නිෂ්පාදන අලෙවිය අයහපත් තත්ත්වයක පවතින කල්හි සම ප්‍රමාණයේ ඉඩම් බෙදා දීමෙන් සාධාරණත්වයක් සහතික නොවේ.. වඩාත්ම වැදගත් වන්නේ, (ගොවි) ක්‍රමයට තිබෙන තාක්ෂණික ඥානය මගින් නිශ්චිත නිෂ්පාදන සීමාව සාර්ථක කර ගැනීමේ ශක්තියයි. මේ ශක්තිය, ආදාන (inputs) හා සේවා සාර්ථකව සපයා ගැනීම අනුව බොහෝ සෙයින්ම වෙනස් වේ. එයින් ඇති වන්නේ විෂමතාවයකි. වේගයෙන් හෝ සෙමින් හෝ වේවා පිරිහීමට යන කාලය ඇත්තෙන්ම නිශ්චිත වන්නේ තිබෙන සම්පත් ප්‍රමාණයන් සහ /හෝ පෙළඹුම් හා සේවා සම්පාදනයව අනුවය. එහෙත් සාර්ව - ආර්ථික හා දේශපාලන ක්‍රමයෙහි හැර, ගොවි ක්‍රමය තුලින් මතුවන බලවේගය අනුව වෙනස්වීම් සිදුවන වේගය අඩු වැඩි විය හැකිය. මේ නයින් බලන විට සෙසු ජනපදවල මෙන් මහවැලි ජනපදවල විවිධ ගොවිකම් ක්‍රම ඇතිවීම පුදුමයක් නොවේ. ඊට සරලම හේතුව, එම ක්‍රමය ක්‍රියාත්මක වූ සංස්ථා තුල එවැනි වෙනස්වීම් ඇති වීම ස්වාභාවික වීමයි. ප්‍රතිපත්ති නයින් බලන විට වැදගත් වන්නේත්, පර්යේෂකයන්ට වඩාත් වැදගත් වන්නේත්, එම ප්‍රතිඵල දැන වූ විශේෂ ක්‍රියාවලියේ ස්වභාවයත්, වෙනත් ජනපද සමග සසඳන විට සිදු වූ වෙනස්කම් වල ගුනාත්මක සමානකම් හෝ අසමානකම්ය.

එම වෙනස්වීම් නිසා ආදායම් ප්‍රමාණ හෝ ආදායම් ඉපැයීමේ ශක්තිය ඒකාන්තයෙන්ම පිරිහී තිබේ ද යන්න තවත් වැදගත් කරුණකි. මහවැලි ජනපද ව්‍යාපාර සම්බන්ධයෙන් අතිකුත් ව්‍යාපාරත් වගා කටයුතු සම්බන්ධතා පිළිබඳ තිබෙන ලේඛණ අනුවත් පෙනී යන්නේ ඉඩම් හි තත්ත්වය වෙනස් වී, නිදසුන් වශයෙන් හවුලේ අස්වැන්න

බෙදා ගැනීමේ තත්ත්වයට හෝ කෘෂිකාර්මික කම්කරුවෙකුගේ තත්ත්වයට පත්වන ඔවුන්ගේ ආදායම් ප්‍රමාණය හෝ ආදායම් ඉපැයීමේ ශක්තිය හීන වන බව බොහෝ දෙනා විසින් පැහැදිලිව හෝ වක්‍රව පිළිගෙන ඇති බවය. දැඩි වූත් ඒකාකාර වූත් ඒ සාධාරණීකරණයේ සත්‍යතාව බොහෝ සෙයින්ම සැක සහිතය: එවැනි වෙනස්වීම් නිසා ඇතැම් ස්ථානවල කලින් ඉඩම් හිමියෙක්ව සිට ගොවියෙකු වඩාත් හොඳ තත්ත්වයට පත්වීමට ඉඩ ඇති හෙයිනි. ගත වූ දශකය තුලදී ග්‍රාමීය ක්ෂේත්‍රයෙහි වැටුප් සීඝ්‍රයෙන් ඉහළ ගොස් තිබෙන බව ප්‍රකට කරුණකි. මේ වැදගත් ප්‍රායෝගික ප්‍රශ්ණය කෙරෙහි පර්යේෂකයන්ගේ අවධානය අනාගතයේ දී යොමු විය යුතුය. ඉඩමක් නැති කෘෂිකාර්මික කම්කරුවෙකුට වඩා ඉඩම් හිමි ගොවියා ඉහළ තත්ත්වයක සිටිතියි පිළිගැනීම සෛද්ධාන්තික මට්ටමෙන් කෙනෙකුට ප්‍රශ්ණ කළ හැකිය. ආදායම අතින් බලන විට ඉඩම් හිමි ගොවියෙකුට වඩා කෘෂිකාර්මික කම්කරුවකු උසස් ද පහත් ද යන්න නිගමනය කළ හැකි වන්නේ සංක්‍රමණ පහසුව, රැකියා අවස්ථා සුලභවීම සහ වැටුප් ක්‍රම වැනි සාධක අනුවයි. තවද, ඇතැම් අවස්ථාවල කුඩා ඉඩම් ප්‍රමාණයක් අයිති වී තිබීම පමණක් එතරම් වැදගත් නොවේ. නිදසුනක් වශයෙන් යාපනය අර්ධද්වීපයෙහි, ගොවියන් සතු භූමි භාගය කුඩා වුවද, එහි ඵලදායීත්වය ඉහළයමින් පවතී. ඒ නිසා ගොවිකම් ව්‍යූහයන්හි වෙනස්වීම් සිදු වී ඇතැයි පෙන්වීමට ප්‍රමාණවත් නොවේ: පෙන්විය යුත්තේ ඒ වෙනස්වීම් හේතු කොට ගෙන, කෘෂි කාර්මික හිමිපෙත්තේ පහළට වැටුණු අයගේ ආදායම් තත්ත්වය හෝ ආදායම් ඉපැයීමේ ශක්තිය පිරිහී තිබේද යන්නයි. මේ අංශය කෙරෙහි පර්යේෂකයන්ගේ නොමඳ සැලකිල්ල යොමුවීම අවශ්‍යය.

ගොවිකටයුතු සම්බන්ධතාවල ඇති තිබෙන වෙනස්වීම් ඉඩමේ ඵලදායීතාවයට බලපා තිබෙන අන්දම ගොවිජනපද පෙදෙස්වල නිරීක්ෂනයට ලක් විය යුතු තවත් අංශයකි. සම්පත් ඇති පුද්ගලයන්ට - වෙළෙන්දන්ට, නිලධාරීන්, තාක්‍ෂණවේදීන් සහ පොහොසත් ගෙවීන් වැනි අයට වගා කළ හැකි ඉඩම් බදු දීමෙන් හෝ විකිණීමෙන් ඒ ඉඩම් වල වඩාත් හොඳ වගා ක්‍රම යෙදවීමට ඉඩ ඇති නිසා උසස් පලදාවක් ඇති විය හැකි බව තර්කානුකූලව අපේක්ෂා කළ හැකිය. ඉඩම් බද්දට ගන්නා අය ගොවි යන්ත්‍රෝපකරණ උපයෝගී කර ගැනීමෙන් කොතරම් ප්‍රමාණයකට නිෂ්පාදන වියදම අඩු කර ගන්නේ ද යන්න දැන ගත නොහැකිය. ඔව්හු ඉන්පසු කම්කරුවන් කුලියට යොදවා එම ඉඩම් වගා කර බොහෝ විට උසස් පලදාවක් උපයා ගනිති. (ලංකා මධ්‍යම බැංකුව, 1984)

එහෙත්, එයින් ප්‍රාග්ධනය නොමැතිවීම එකම බාධකය බවත්, ණය දීම මගින් පදිංචිකරුවන්ට ප්‍රාග්ධනය ලබා දීමෙන් ඔවුන්ගේ ප්‍රශ්ණ විසඳෙතැයි නිගමනය කළ යුතු නොවේ. බද්දට හෝ වෙනත් ක්‍රමයකින් ඉඩම් ලබා ගන්නා සම්පත් ඇති ගොවීහු සිය සමාජ තත්ත්වය සහ දේශපාලන සම්බන්ධතා උපයෝගී කරගෙන ආයතනික ව්‍යූහය තමන්ගේ ප්‍රයෝජනයට ගැනීම සිදුවිය හැක්කකි. දුප්පත් ගොවියාට තම කටයුතු සඳහා අවශ්‍ය සම්පූර්ණ මූල ධනය ණයක් වශයෙන් සපයා දෙනු ලැබුවත්, උක්ත වාසි ඔහුට ලබා ගත නොහැකි වනු ඇත. කෙසේ වෙතත් එය, ආයතනයන්ගෙන් ණය ලබා ගැනීමේ හැකියාවට අධික වැදගත්කමක් ආරෝපනය නොකරන තාවකාලික සිද්ධාන්තයකි. එයින්, අයිතිකරුවන් විසින් වගා කරන ඉඩම් වල ඵලදායීත්වයත් බද්දට ගත් ඉඩම් වල ඵලදායීත්වයත් අතර නිෂ්පාදන විච්‍යලයන්, සරල නව සම්භාවිත ආර්ථික රාමුවක් තුල සිට විශ්ලේෂණය කිරීම සාවද්‍ය නිගමනවලටත් සාවද්‍ය ප්‍රතිපත්ති නියමයන්ටත් තුඩු දිය හැකි බව ද හැඟී යයි.

ගොවි කටයුතු සබඳතාවල වෙනස් වීම තුලින් උද්ගත වන "සම්පත් අතමාරු වීමේ" ඵලයට සම්බන්ධ තවත් ප්‍රශ්ණ සමූහයක් ඇත. ඇතැම් දක්ෂ ගොවීන් අතිරික්ත නිෂ්පාදනයක් ලබන බව පෙනෙන නමුදු, ඒ අතිරික්තය කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ගොවිකටයුතු සඳහා යළි ආයෝජනය කරන්නේ ද නැත්නම් වෙනත් නාගරික මධ්‍යස්ථානයකට එය මාරු කරන්නේ දැයි නොදනිමු. ඒ අතිරික්තය ප්‍රදේශයෙන් පිටතට මාරු කිරීම බෙහෙවින් සිදු විය හැකිය. අතිරික්තය උපයෝගී කරගනු ලබන ක්‍රමය මෙන්ම අතිරික්තයේ ප්‍රමාණයත් එය බෙදී යන ආකාරයත් වැදගත් වන නිසා එම විෂය පිළිබඳ වඩාත් දැඩි පර්යේෂණයක් කිරීම අවශ්‍යය.

පර්යේෂකයන් විසින් මූලික වශයෙන් තම අවධානය යොමු කළ යුතු ප්‍රශ්ණ සතරක් ඇත. එනම්:

(අ) මහවැලි ජනපදවල ගොවිකටයුතු සබඳතා මුලින් පැවති තත්තවයට වඩා වේගයෙන් වෙනස්වීමට හේතු වූ සාධක කවරේද?

(ආ) පංගු ක්‍රමයට වගා කරන්නන් හා සංක්‍රමණ කම්කරුවන් වැනි විවිධ පන්තිවලට ඒ වෙනස්වීම්වල බලපෑම නිසා ඇති වූ ප්‍රතිඵල කවරේද? වෙනත් වචනයෙන් කියතොත් වැඩි වාසි ලැබුණේ කවරෙකුටද?

(ඇ) වෙනස්වන ගොවි කටයුතු සබඳතා කොතරම් දුරට ඵලදායීත්වය සහ අතිරික්ත යළි ආයෝජනය කිරීම කෙරෙහි බලපා තිබේද? සහ,

(ඈ) එයින් යම්කිසි අනිෂ්ඨ තත්ත්වයක් ඇති වුවහොත් එය මඟහරවා ගැනීමට, වර්ධනය අනුව බලන විට හෝ සමාජ යුක්තිය අනුව බලන විට හෝ අනුගමනය කල යුතු ප්‍රතිපත්ති කවරේ ද? නැතහොත් පරිපාලනමය වශයෙන් හා දේශපාලනික වශයෙන් ඇති කළ හැකි ආයතනික ව්‍යුහයන් යටතේ "සමාජ යුක්තිය" සමග වර්ධනය සහතික කළ හැකි ප්‍රතිපත්ති සමූහයක් තිබේද?

ගොවිපල යාන්ත්‍රීකරණය, විශේෂයෙන්ම ට්‍රැක්ටර් භාවිතය කොතරම් ප්‍රමාණයකට, කවර තත්ත්වයන් යටතේ, ගොවිකටයුතු සබඳතාවන්හි අර්ථවත් වෙනස්වීම ඇති කිරීමට හේතු වී තිබේද යන්න තවත් වැදගත් ප්‍රශ්ණයකි. මේ ප්‍රශ්ණය, මහවැලි ගොවිකටයුතු ක්‍රමයට පමණක් නොව වියලි කලාපයේ අනිකුත් ගොවි ජනපද වලට ද අදාල වන්නකි. මේ සම්බන්ධයෙන් ජයවීර (1972 : 43) මෙසේ ලියයි:

"වැඩවසම් ක්‍රමයට අයත් ඉඩම් හිමියාට වඩා යැපීම් ගොවියාට තමන්ට පාලනය කර ගත නොහැකි නව පීඩනයකට භාජනය වී ඇත. නව තාක්ෂනික වැඩවසම් ක්‍රමයක් ට්‍රැක්ටර් අයිතිකරුවන් ආශ්‍රිතව වැඩී තිබේ...... සිය කුඹුරු ඉඩමේ කටයුතු වල පාලනය සෙමින් සෙමින් යැපීම් ගොවියාගෙන් ට්‍රැක්ටර් හිමියන් අතට පත්වී ගෙන යයි."

ඇතැම් ජනපදවල අන්‍යයන්ට වඩා ඉක්මණින් තමාට අයත් ඉඩම් ප්‍රමාණය වැඩි කර ගැනීමට රෝද හතරේ ට්‍රැක්ටර් හිමියන්ට හැකි වී තිබෙන බව රණතුංග සහ අනිකුත්

පර්යේෂකයින් විසින් (1981:49) 1981 මුල් භාගයෙහි දී පෙන්වා දී තිබේ. "..." රෝද හතරේ ට්‍රැක්ටර් නිසාම තමාට අයත් ඉඩම් ප්‍රමාණය වැඩි නොවේ. එය සිදු විය හැක්කේ ශීඝ්‍රයෙන් වගා කිරීම සඳහා අධික වියදමක් දැරිය යුතු තත්ත්වයක් ඇති වුවහොත් යයි ඔව්හු සඳහන් කරති. (1981:49) ට්‍රැක්ටර් හිමිකමත්, ඉඩම් අයිතිය වැඩි කර ගැනීමත් අතර නිශ්චිත පරස්පර සම්බන්ධයක් තිබෙන බව පැරින්ටන් සහ අනිකුත් පර්යේෂකයන් (1980) විසින් සනාථ කර තිබේ. ට්‍රැක්ටරය වූ කලී බෙදිය නොහැකි මූල ධන සම්භාරයකි. ට්‍රැක්ටරය මගින් එක් දිනකදී බොහෝ අක්කර ප්‍රමාණයක් වගාව සඳහා පිළියෙළ කරගත හැකිය. එබැවින් ට්‍රැක්ටරයේ වටිනාකමට සමාන කටයුතු ප්‍රමාණයක් ඉටු කිරීමට ට්‍රැක්ටර් හිමියන්ට පුළුවන් වේ.

ට්‍රැක්ටර් උපයෝගී කර ගැනීම නිසා ඉඩම් පුද්ගලයන් කීප දෙනෙකු අතට පත්වීමට මඟ පැදෙනවා පමණක් නොව වගා කටයුතු අධිකව කෙරෙන අවස්ථාවන්හි ස්වකීය ශ්‍රම බලය විකිණීමට බලාපොරොත්තු වන කෘෂිකාර්මික කම්කරුවන්ට සහ දුප්පත් ගොවීන්ට ආදායම් උපයා ගත හැකි අවස්ථා ද අඩු විය හැකිය. ලිප්ටන් (Lipton) සඳහන් කළ පරිදි, කුලියට ගන්නා ශ්‍රමය වෙනුවට ට්‍රැක්ටර් උපයෝගී කරගනු ලැබුවහොත් පාඩුව වඩාත්ම සිදු වන්නේ ආදායමක් ලබා ගැනීම පිණිස වෙනත් ස්ථානවලට යාම මැනවැයි තීරණය කර ගත් අයටය. (1984:60). මේ තත්ත්වය ඔහු තවදුරටත් මෙසේ ස්ථිර කරයි: "තෙත් කලාපයේ බොහෝ ගම්වලට ලැබෙන ආදායමෙන් අඩක වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේ වියළි කලාපයට සංක්‍රමණය වන කම්කරුවන්ගේ ශ්‍රමයෙනි. එවැනි සංක්‍රමණික වගාව සඳහා ඉඩම් පිළියෙල කර දීමෙන් සහ ගොයම් පැගීමෙන් ලැබෙන ආදායම මත බලාපොරොත්තු රඳා සිටිති. එවැනි රැකියායි ට්‍රැක්ටරය විසින් අඩු කරනු ලබන්නේ".

ඇතැම් පර්යේෂකයන් පෙන්වා දී ඇති පරිදි ඉඩම් පුද්ගයන් කීප දෙනෙකු අතට පත්වීම නිසා කෘෂිකාර්මික කම්කරුවන්ගේ ශ්‍රමයට ඇති ඉල්ලුම වැඩිවීමට හේතු විය හැකිය. එය සංක්‍රමණික කම්කරුවන්ට තම ගමෙහි හෝ ජනපදයෙහි තිබෙන කම්කරු වැඩට වඩා විශේෂයෙන්ම වාසියක වනු ඇත. එසේ වුවද, ලිප්ටන් පෙන්වා දී ඇති පරිදි, යාන්ත්‍රීකරණය නිසා ශ්‍රමයට තිබෙන අධික ඉල්ලුම අඩු වූ විට එය ගොවි කටයුතු සම්බන්ධතා පිරිහීමට ඒකාන්තයෙන්ම හේතු විය හැකිය. ට්‍රැක්ටර් උපයෝගීකර ගැනීම ගොවිකටයුතු සම්බන්ධතාවන්ට අහිතකර තිබෙන බවට සාක්ෂි තිබෙන නමුදු, අඩු පොලියට ණය සැපයීමේ සහ වෙනත් ක්‍රම මගින් ට්‍රැක්ටර් ලබා ගැනීමට උපකාර කිරීම රජයේ ප්‍රතිපත්ති මගින් මෙහිදී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණකි. ට්‍රැක්ටර් පාවිච්චි කිරීම සඳහා උපකාරක ක්‍රමයක් තිබිය යුතුද? තිබිය යුතු නම්, එය කවර අවස්ථාවන්හි ක්‍රියාත්මක විය යුතුද යන වැදගත් ප්‍රශ්ණය කෙරෙහි පර්යේෂකයන්ගේ අවධානය යොමු විය යුතුය.

තෙත් කලාපයෙහි ගොවිකටයුතු සම්බන්ධතාවන්ට අදාල ප්‍රශ්ණ වියළි කලාපයේ තිබෙන ප්‍රශ්ණවලට වඩා ඉතා බෙහෙවින්ම සංකීර්ණය. නිදසුනක් වශයෙන්, රත්නපුර, කළුතර සහ කෑගල්ල දිස්ත්‍රික්කයන්හි තට්ටුමාරු සහ කට්ටිමාරු වගා විධිවල ප්‍රධාන තැනක් දෙන සංකීර්ණ ඉඩම් භුක්ති ක්‍රමය තෙත් කලාපයේ වී ගොවිතැන් ක්‍රමයේ ලක්ෂනයකි (මුවර් සහ වික්‍රමසිංහ, 1978). ඊට අතිරේකව, අඳ ගොවි ක්‍රමය තෙත් කලාපයෙහි බෙහෙවින් ප්‍රචලිත වූවකි. (ධන්හම් සහ ප්‍රනාන්දු, 1986). මේ භුක්ති ක්‍රම ඵලදායීත්වයට ඉතාමත්ම අහිතකර ලෙස බලපාන බව පිළිගනු ලබන නමුදු කලාපයේ

විවිධ කොට්ඨාශවල එය කෙතරම් ප්‍රමාණයකට සිදු වේ දැයි නිශ්චය කර ගැනීමට විශ්වාසදායක දත්තයන් නොමැත. දත්තයන් නොතිබීම නිසා, මැත අතීතයේ ප්‍රවණතාවයන් විශ්ලේෂණය කිරීමට පුළුවන් කමක් නැත. අද ගොවීන් සහ ඉඩම් හිමියන් අතර සම්බන්ධය ක්‍රමවත් කිරීමට දශක තුනක පමණ කාලයක් තුල ගොවිකටයුතු ප්‍රතිසංස්කරණ පණත් මගින් තැත්කර තිබේ. 1958 කුඹුරු ඉඩම් පනත භුක්ති ක්‍රමය කෙරෙහි බල පා ඇති අයුරු සවිස්තරව අධ්‍යයනය කර තිබෙන අතර වී ගොවිතැන් ක්ෂේත්‍රයෙහි සීඝ්‍ර ලෙස එළදා වර්ධනයක් පැවති කාලයන් තුලදී ක්‍රියාත්මක වූ 1979 ගොවිජන සේවා පනතේ බලපෑම මෙතෙක් සවිස්තරව අධ්‍යයනය කර නැත. ඒ සඳහා අවශ්‍ය දත්ත ඒක්රැස් කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතු අතර, විවිධ පළාත් වලින් තෝරා ගත් ගම්වල ක්ෂේත්‍ර මට්ටමේ ගැඹුරු අධ්‍යයන මාලාවක් පටන් ගැනීම අවශ්‍යය. කෘෂිකර්මයට සම්බන්ධ ජාතික මට්ටමේ සංඛ්‍යාලේඛණ තොරතුරු අවශ්‍ය ප්‍රමාණයට නිරවද්‍ය නොවන බැවින් ක්ෂේත්‍ර මට්ටමේ ගැඹුරු අධ්‍යයනයන්ගේ අතිශය වැදගත්කම ප්‍රකට වේ. තවද ක්ෂුද්‍ර මට්ටමෙ ගැඹුරු අධ්‍යයනයකින් පමණක් අවබෝධ කර ගත හැකි ප්‍රාදේශීය සහ සංස්ථානික වෙනස්වීම් ජාතික මට්ටමේ දත්තයන්හි සැඟ වී පවතිනු ඇත.

ගත වූ දශකයක පමණ කාලය තුලදී ගොවිකටයුතු සම්බන්ධතා ඉතාම උග්‍ර තත්ත්වයකට පත් වී තිබෙන බව තෙත් කලාපයෙන් ලැබෙන සාක්ෂි පෙන්නුම් කරයි. ඒ පිරිහීමට ඉඩම්වල වැඩිවන ජනගහනයේ බලපෑම නිසැකවම බෙහෙවින් උපකාර වී ඇත. වී ගොවිතැන් අංශයෙහි කුඩා බිම් කොටස්වල වැදගත්කම ඉහළ යෑම, තෙත් කලාපයෙහි ගොවිකටයුතු සම්බන්ධතාවන් පිළිබඳ ප්‍රශ්ණයේ බැරෑරුම්කම වැඩිකර ඇති බව ඒකාන්තයෙන්ම පැහැදිලි ලෙස ප්‍රකට වේ. මේ තත්ත්වයේ විවිධ පැති සහ ස්ර්ර්ධන කාර්යය සඳහා ඒවායේ සම්බන්ධය ජාත්‍යන්තර ආහාර හා කෘෂිකර්ම සංවිධානය සැකෙවින් සඳහන් කරයි:

මිනිසා සහ ඉඩම් අතර පිරිහීගෙන යන මේ සම්බන්ධතාව සමග අනිවාර්යයෙන්ම බැඳී පවතින වෙනත බාධක තිබේ: ඔහුගේ දිළිඳු බව, මන්ද පෝෂණය, ආරක්ෂාව නොතිබීම: (කෘත්‍රිම) පොහොර සහ වෙනත් යෙදවුම් ගොවි යන්ත්‍රෝපකරණ සහ සේවා ලබා ගැනීමට තිබෙන දුෂ්කරතාව, දුරා කත අලෙවි ක්‍රමයකට නිරතුරුව ගොදුරු වීම, බොහෝ කලක්ම විශාල වශයෙන් ණය අවශ්‍ය බව, එසේ නැත්නම් ණය ලබා ගැනීමට කිසිදිනක සුදුසුකම් නොලබන බව පිළි ගැනීමයි. හුදෙක්ම සාධාරණත්වය පිළිබඳ ප්‍රශ්ණ නොවේ. මේ බාධක පෞද්ගලික නිෂ්පාදකත්වයේ පිරිහීමට අනිවාර්යයෙන්ම තුඩු දෙන නිසාත්, ජාතික කෘෂිකාර්මික නිෂ්පාදනය අඩුවීමට තුඩු දෙන නිසාත් ඒ බාධක බෙහෙවින් වර්ධනයට බලපායි. (දින රහිත : 26)

දැනට විශේෂයෙන්ම තෙත් කලාපයෙහි පවතින තත්ත්වය වර්ධනය හා බෙදා හැරීම අතින් බලන විට නිසැකයෙන්ම අසතුටුදායකය. ප්‍රදේශයෙහි වගා කරන්නන්ගෙන් වැඩි දෙනාට අතිරික්තයක් ඇති වන පරිදි නිෂ්පාදනයක් කළ නොහැකිය. බොහෝ දෙනාට වගාව සඳහා පවුල් ශ්‍රමයේ වටිනාකමක් ඇතුළත්ව යන වියදම පියවා ගැනීමට පවා අපහසුය. මෙයින් හැඟෙන්නේ වගාව සඳහා උපයෝගී කර ගනු ලබන පවුලේ ශ්‍රමයට උචිත සාධාරණ ආදායමක් උපයා ගැනීම සඳහා ඔවුන්ට අයත් ඉඩම් උපකාර නොවන බවය. වඩාත්ම අනතුරුදායක කරුණ වන්නේ වගා කල ඉඩම්වලට අනවශ්‍ය ශ්‍රම බලය අන්තර් ග්‍රහණය කර ගැනීමට ප්‍රමාණවත් වැඩීමත් සමග පිරිහී ඉඩම් තව තවත් කැලිවලට

කැඩීයාමය. නිදහස් වෙළඳ ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් පසු වී වල සැබෑ මිල පහළ යෑමත්, සෑම ඉඩම් ඒකකයක වගා කටයුතු සඳහා වැය වූ මුදල සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ යෑමත් සිදු වී ඇති බව පෙන්වා දී තිබේ. (ගුණසිංහ : 1986) මෙයින්, ගොවීන් සඳහා සතුටුදායක තත්වයක් පැවති බව තිබෙන සාධක වලින් හෙළි වේ. උක්ත කාලය ඇතුළත, දිස්ත්‍රික්ක එකක හෝ දෙකක හැර නෙත් කලාපයේ සියළුම දිස්ත්‍රික්ක වල ඵලදායිත්වය ඉතා සතුටුදායක ලෙස වර්ධනය වී ඇති බැව් වාර්තා වී ඇත. පෙනෙන්නට තිබෙන එම පරස්පර විරෝධතා පැහැදිලි කිරීමට ගුණසිංහ (1986:42-43) තැත් කරන්නේ මෙසේයි.

"වී, යැපීමට ගන්නා භෝගයක් මෙන්ම වෙළඳ භෝගයක් ද වන නිසා, සැබෑ මිළ පහළ යමින් නිෂ්පාදන වියදම ඉහළ යද්දී නිෂ්පාදනය වැඩි වීම සමහර විට සිදු විය හැකිය. සහන මිලට සහල් සලාකය දීම නතර කළ තැන් පටන් යැපීම සඳහා සිය අස්වැන්න කෙරෙහි ගොවියා තැබූ බලාපොරොත්තුව අධික විය. ගොවි නිෂ්පාදනයට ඇතුලත් වූ ඒ යැපීම් කොටස් මිල සමහර විට අනම්‍ය විය."

කෙසේ වෙතත්, භුක්ති ව්‍යුහය යෙදවුම් සඳහා මුදල් ගෙවීමට ගොවියාට තිබෙන හැකියාව සහ අධික ලෙස ශ්‍රමය යෙදීමෙන් ඉහළ යන නිපැයුම් සීමාව සැලකිල්ලට ගත් විට ඉහත සඳහන් විස්තරය ප්‍රමාණවත් දැයි කෙනෙකුට ප්‍රශ්න කළ හැකිය. මේ ලිපියෙහි එම කරුණ සවිස්තරව විමසීමට නොපුළුවන. නමුත් එහි වැදගත්කම සලකන විට, නෙත් කලාපයට අයත් දිස්ත්‍රික්කවල නිෂ්පාදන වර්ධනය මෙන්ම ඉඩම් හිමියන්, අඳ ගොවීන් සහ කෘෂිකාර්මික කම්කරුවන් අතර නිෂ්පාදනය බෙදී ගොස් ඇති ආකාරය ගැඹුරින් විමසා බැලීම අවශ්‍ය බව පෙනේ.

ගොවිකටයුතු සම්බන්ධතා දියුණු කි රීමට අවශ්‍ය ප්‍රතිපත්ති පිළිබඳව විමසා බැලීම තවත් වැදගත් කරුණකි. පැරණි අත්දැකීම් වලින් පෙන්නුම් කරන පරිදි, ගොවි කටයුතු සම්බන්ධතාවන්ගේ පිරිහීම නතර කිරීම ජනපද ව්‍යාපාර මගින් හෝ නීතියෙන් පැනවෙන බාධක වලින් හෝ නුපුළුවන. ගොවිකටයුතු සම්බන්ධතාවන් නිශ්චිත කෙරෙන්නේ වඩාත් සංකීර්ණ වූ සාධක සමුදායක් විසිනි. එයින් සමහරක් එක්තරා ගොවිකටයුතු ක්‍රමයක් ඇතුලත තිබෙන අතර සමහරක් සාර්ව - ක්‍රමයෙන් (Macro - System) උද්ගත වෙයි. සමහර විට ඉඩම් නිරවුල් කිරීමේ මඳ විරාමයකට කල් දෙයි. තවද, සමහර විට, ජනාවාස ව්‍යාප්ත කිරීමේ සීමාවට දිවයින පැමිණ තිබෙන බව පෙනේ. මේ තත්ත්වය තුල, වර්ධනයටත් කෘෂිකාර්මික නිෂ්පාදන අතිරික්තය වඩාත් හොඳින් බෙදී යාමටත් උපකාර වන ක්‍රමයකට සම්බන්ධතාවන්ගේ ව්‍යුහය ප්‍රතිසංස්කරණය කිරීම කෙරෙහි අවධානය යොමු විය යුතුමය. සාධාරණත්වය සමග වර්ධනයත් සිදුවන පිළිවෙලකට පවතින ගොවි කටයුතු සම්බන්ධතා ව්‍යුහය ප්‍රතිංස්සකරණය කිරීමේ විෂය සම්බන්ධයෙන් සෑහෙන වැඩ කොටසක් කළ යුතුව තිබේ.

දියුණු විද්‍යා තාක්ෂන භාවිතය වැඩිකිරීම සඳහා "ගොවීන්ගේ ගොවිකටයුතු ක්‍රමය, බාධකයක් වී කලක් ගත වීමෙන් එය බිඳී යෑමට ඉඩ තිබේ නම්, නිෂ්පාදන වර්ධනයත්, සාධාරණ ලෙස ආදායම බෙදී යාමත් සහතික කරමින් "ගොවීන්ගේ ගොවිකටයුතු ක්‍රමය" දිගටම පවත්වාගෙන යා හැකිද? නැත්නම් ඒ වෙනුවට අපට යෝජනා කළ හැකි අනිත් කෘෂිකාර්මික සංවිධාන ක්‍රමය කුමක්ද? යන්න තවත් වැදගත් ප්‍රශ්නයකි. පර්යේෂණයෙහි යෙදුනු බොහෝ දෙනෙක් සාමූහික ගොවිකම් ක්‍රමය (Group Farming) විකල්පයක් වශයෙන්

9078

දක්වා තිබේ. අනික් අතින්, නිදසුනක් වශයෙන්, දැනට පවතින ව්‍යුහය, යෝජිත ව්‍යුහයට පරිවර්තනය කළ හැක්කේ කෙසේ දැයි හුදෙක් පර්යේෂණ ව්‍යායාමයක් වශයෙන් පමණක් නොව ක්‍රියාත්මක කළ හැකි විකල්ප ප්‍රතිපත්තියක් වශයෙන් ද සොයා බැලීම අවශ්‍යය.

**ප්‍රමුඛත්වය දිය යුතු පර්යේෂණ විෂයයන්**

ඉහත සඳහන් විමර්ශණයෙහි, ගොවි කටයුතු සම්බන්ධතා අංශයෙහි මුඛ්‍ය ප්‍රශ්ණ බොහෝමයක්ම සැකෙවින් ඉස්මතු කරන ලද අතර පර්යේෂකයන්ගේ මනස යොමු විය යුතු ප්‍රශ්ණ බොහෝමයක් ද පෙන්වා දෙනු ලැබීය. ආර්ථිකයෙහි කෘෂිකර්ම අංශයට තිබෙන වැදගත් ස්ථානය, එහි සංකීර්ණත්වය සහ සෙසු අංශ සමග තිබෙන අන්‍යොන්‍ය සම්බන්ධය සළකා පර්යේෂණයට භාජනය විය යුතු වැදගත් කරුණු බොහොමයක් තිබේ. ඒ කරුණු අතුරෙන් කෙටිකාලීන වූත් මධ්‍ය කාලීන වූත් ගොවිකටයුතු පර්යේෂණ වැඩසටහන පහත සඳහන් කරුණු වලට ප්‍රමුඛත්වය දිය යුතු යයි අපට හැඟේ.

(1) බදු දීමේ ක්‍රමයටත්, බද්දට ගැනීමේ ක්‍රමයටත් අවධානය යොමු කරමින්, ගොවීන් නැවත පදිංචි කිරීමේ ව්‍යාපාරයන්හි නීතිමය නොවූ ඉඩම් භුක්ති ක්‍රමය අධ්‍යයනය කිරිම. බදු දීමට වැඩියෙන් කැමැත්ත දක්වන පදිංචිකරුවන්ගේ සමාජ තත්ත්වයේ සමාජ - ආර්ථික ලක්ෂණ හඳුනා ගැනීම සහ බද්දට ගැනීමට බෙහෙවින් ඉදිරිපත් වන්නන් තෝරා බේරා ගැනීම. ඒ ක්‍රියාවලින්, ඵලදායිත්වය කෙරෙහිත් සාධාරණත්වය කෙරෙහිත් ඇති බලපෑම.

(11) නෙත් කලාපයේ ගොවි ඉඩම් තදින් කැබලි වලට කැඩී යාමෙන් ඉඩම ලබා ගැනීමට තිබෙන බලවත් අභිලාෂයක් පවතින තත්ත්වයක් තුල දැනට තිබෙන ගොවිකටයුතු සම්බන්ධතා පවත්වා ගනිමින් සාධාරණත්වය සමග ඵලදායිත්වයක් මුදුන් පමුණුවා ගත හැක්කේද? උසස් ඵලදායිත්වයක් හා සාධාරණත්වය සහතික වන පරිදි කළ හැකි ප්‍රතිව්‍යුහකරණ කවරේ ද?

(111) ගොවිකටයුතු සම්බන්ධතාවන්ගේ ස්වභාවයටත් සුපුරුදු වගා ක්‍රමයන්ටත් බලපාන කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ උපයෝගී කර ගැනීම පුළුල් කිරීම සැලකිල්ලට ගෙන වර්ධනයත් යුක්තියත් සහතික කරන කවර විධියේ තාක්ෂණ ක්‍රම උපයෝගී කර ගත යුතුද?